SLGURU.LK

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Sri Jayawardenepura Education Zone

දෙවන වාර පරීක්ෂණය -2026
Second Term Test - 2026

ශ්‍රේණිය Grade 10	විෂයය Subject නාට්‍ය හා රංගකලාව	පත්‍රය Paper I, II	කාලය Time පැය 3 යි

නම Name ..... විභාග අංකය Index Number .....

අමතර කියවීම් කාලය Additional Reading Time	- මිනිත්තු 10 යි - 10minutes	අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

නාට්‍ය හා රංගකලාව (සිංහල) i

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරේ හි අංකයට සැපදෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1 කොටස

❖ පහත දැක්වෙන කවි, ගීත හා දෙබස් ඇසුරෙන් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. (ඇය ළඟට ගොස්) මේවා හරි ලාබාල පාටයි. වයස අවුරුදු දහයක්වත් පැනල නෑ. (ගොස් ඇය අතින් අල්ලයි) නංඟී හාමී!

B. රන්දර සිරියා පරදන - රූපෙට වටිනා නිමම කොමළ තරුණි

C. ලප නොමවන් සද සේ සොමි ගුණේනා
ආදර දිනනා සිසු සැවොමා

D. වඩිග පුර දේසෙන
සත්දෙන බමුණු ඇවිදින

E. යුද්දෙට මං ගීයා
ගැනී ගෙදර තියා

1. දේශීය නාඩගම් සම්ප්‍රදාය ඇසුර කර ගනිමින් කරන ලද නාට්‍ය නිර්මාණය වන්නේ,
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

2. පහතරට ප්‍රදේශයේ රඟ දක්වන ලද ශාන්තිකර්මයක් වන්නේ,
(1) A හා C (2) A හා D (3) B හා C (4) D හා E

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

3. ස්ත්‍රී වේශයෙන් ඉදිරිපත් කරනු ලබන්නේ,
(1) A හා B (2) C හා D (3) B හා C (4) D හා E

4. මෙන්ඩිස් ජයසේනයන්ගේ විශේෂිතම පරිවර්තන නාට්‍ය කෘතියක් වන්නේ,
(1) B (2) C (3) D (4) E

5. සුනියම් යාගය ශාන්තිකර්මයේ අන්තර්ගත අන්තර් රංගමය අවස්ථාවක් වන්නේ,
(1) A (2) B (3) C (4) D

6. "නෘත්ත" යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) භාව ප්‍රකාශනයෙන් තොර හුදු නර්තනයකි. (2) මුද්‍රා නාට්‍ය අංගයකි.
(3) මණිපුරි නර්තන අංගයකි (4) කාව්‍ය ශාස්ත්‍රයෙහි අන්තර්ගත සංකල්පයකි.

7. වේදිකා නාට්‍යයක් පිළිබඳව සත්‍ය නොවන්නේ,
(1) සජීවී බව සුවිශේෂී වේ.
(2) නාට්‍යෝචිත අවස් මගින් ඉදිරිපත් කරයි.
(3) පෙළ සාහිත්‍යය සුවිශේෂී ලක්ෂණයක් නොවේ.
(4) සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.

8. අනුශාංගික කලා ගණයේ ලා නොසැලකෙන්නේ,
(1) පෙළ රචනය (2) වේෂ භූෂණ (3) අංග රචනය (4) අලෝකකරණය

9. චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත්වීමේ නළ කාර්යය,
(1) අභිරූපණය (2) භාව ප්‍රකාශනය (3) රූපණය (4) සමාරෝපය

10. පහත සඳහන් මාධ්‍ය අතුරින් දෘශ්‍ය මාධ්‍ය ගණයේ ලා සැලකෙන්නේ,
(1) මූර්ති හා කැටයම් (3) චිත්‍රපට හා ටෙලි නාට්‍ය
(2) බැලේ හා ඔපෙරා (4) මුද්‍රා නාට්‍ය හා කාටුන්

11. එදිනෙදා ජීවිතයේ දී ආයාසයකින් තොරව අප විසින් කරනු ලබන ඇවිදීම වැනි චලන හඳුන්වනු ලබන්නේ,
(1) ස්වාභාවික චලන (3) තාලානුකූල චලන
(2) නිර්මිත චලන (4) කෘතිම චලන

12. පහත සඳහන් නිර්මාණ අතුරින් වාචික අභිනය දක්නට ලැබෙන්නේ,
(1) අභිරූපණය (3) මුද්‍රා නාට්‍ය
(2) නාට්‍ය නිර්මාණය (4) ඔපෙරා

13. කතාන්දරයක සහ වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන පොදු කරුණක් වන්නේ,
(1) චරිත නිරූපණය (3) අනුශාංගික කලා
(2) සංවාද මඟින් ගොඩ නැගීම (4) ප්‍රබල ගැටුම් අවස්ථාවක්

14. දේවදූතයෙකු සේ වේස් ගන්වන ලද කුඩා පිරිමි දරුවෙකු පිළිබඳ සඳහන් වන බෞද්ධ පූජා කර්මය වන්නේ,
(1) මිලින්ද ප්‍රශ්නය (3) ආලවක දමනය
(2) දොරකඩ අස්න (4) යුගාසන බණ

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

15. මහාචාර්ය එදිවීර සරච්චන්ද්‍රයන් විසින් පුරාවෘත්තයක් ඇසුරින් නිර්මාණය කළ විශිෂ්ට නාට්‍යයක් වන්නේ,
    (1) මනමේ
    (2) සිංහබාහු
    (3) පබාවතී
    (4) කදා වළලු

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති වරණ 04 අතරින් නොගැළපෙන වරණය තෝරන්න.

16. (1) නානුමුරය (2) වඩිග පටුන (3) දරු නැළවිල්ල (4) කපු යන් මංකාරිය

17. (1) සුනියම් යක්ෂණිය (2) කළු යකා (3) මංගර දෙවි (4) රීරි යකා

18. (1) අසුපාලී (2) වඩිග බමුණෝ (3) මැණික්පාල (4) වසවර්ති

19. (1) සති පිරිත (2) මිලිඳු ප්‍රශ්නය (3) සන්නියකුම (4) ආලවක දමනය

20. (1) සළු පැළඳීම (2) හවරිය පැළඳීම (3) තෝඩු පැළඳීම (4) ගමන් යෑම

❖ ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

මූල නාට්‍යය	මූල නාට්‍යකරු	අනුවර්තන/ පරිවර්තන නාට්‍ය	අනුවර්තන/ පරිවර්තන නාට්‍යකරු
'ටී හවුස් ඕෆ් ද ඔගස්ට් මූන්'	වර්නස් හයිඩර්	A	සුගතපාල ද සිල්වා
B	ඇල්බෙයා කැමූ	විනිශ්චය	පරාක්‍රම කිරිඇල්ල
ඉක්නෙවීටාඉ	C	බෙර හඬ	බන්දුල ජයවර්ධන
ද කොකේසියන් සර්කල් චෝක්	බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්	හුණුවටයේ කතාව	D .....
E	ඇන්ටන් චෙකෝෆ්	මහගෙදර	රන්ජිත් ධර්මකීර්ති

21. A කොටුවට අදාළ පිළිතුර වන්නේ,
    (1) බෝධීකාරාරයෝ
    (2) සත සහ සත
    (3) ඇසළ සඳ අවන්හල
    (4) මරාසාද්

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

22. B කොටුවට අදාළ පිළිතුර වන්නේ,
(1) ද ජස්ට් (2) ගැලීලියෝ (3) උත්තමාවී (4) වරෙන්තු

23. C කොටුවට අදාළ පිළිතුර වන්නේ,
(1) මැක්සිම් ගෝර්කි (2) ටෙනසි විලියම්ස් (3) සොෆොක්ලීස් (4) රේ කුනී

24. D කොටුවට අදාළ පිළිතුර වන්නේ,
(1) එදිරිවීර සරච්චන්ද්‍ර (3) ධම්ම ජාගොඩ
(2) සුගතපාල ද සිල්වා (4) හෙන්රි ජයසේන

25. E කොටුවට අදාළ පිළිතුර වන්නේ,
(1) ද චෙරි ඔර්චාර්ඩ් (2) ඇපල් කාර්ට් (3) ද ෆාදර් (4) ද ප්‍රපෝසල්

26. වේදිකාව මත රංගනය ඉදිරිපත් කිරීමේ දී සංවාද කොටස් හඬ නඟා පැහැදිලිව උච්චාරණය කිරීමට උපකාරී වන රංග අභ්‍යාසය වන්නේ,
(1) ශ්වසන අභ්‍යාස හා ශිථිලකරණ අභ්‍යාස
(2) කටහඬ අභ්‍යාස හා ශ්වසන අභ්‍යාස
(3) කටහඬ අභ්‍යාස හා සංවේදන අභ්‍යාස
(4) ශ්වසන අභ්‍යාස ඇඟ උණුසුම් කිරීමේ අභ්‍යාස

27. ක්ෂණික නිරූපණ පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
(1) ඒකලව සහ සාමූහිකව සිදු කළ හැකිවේ.
(2) පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරයි.
(3) පිටපතකට අනුව ඉදිරිපත් කරයි.
(4) නිරූපණයෙහි නිර්මාණශීලී චින්තනය හා පරිකල්පනය වැදගත් වේ.

28. "මෝරු සහ දූපත" රංග ක්‍රීඩාව පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) එලන ලද පත්තර පිටු එකක් පමණ භාවිත වේ.
(2) මෝරු එක් වරක් කන විට දූපත් ප්‍රමාණය දෙගුණ වේ.
(3) මෝරෙක් පැමිණ එක් මිනිසෙකු සපා කෑ විට එම පුද්ගලයා ද මෝරෙක් බවට පත්වේ.
(4) කෑ නොගසා දූපතට ගොඩවිය යුතු අතර කෑ ගැසූ විට මෝරු පැමිණ සපා කයි.

29. රංග ක්‍රීඩා කිරීමෙන් සිදුවන ප්‍රයෝජනයක් නොවන්නේ,
(1) සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ලැබීම.
(2) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව ලැබීම.
(3) ජයග්‍රහණය පමණක් ඉලක්කගත වීම.
(4) අවධානය හා අවධානය පිළිබඳ දියුණුවක් ලැබීම.

SLGURU.LK

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

30. ශිථිලකරණ අභ්‍යාසයක් සඳහා නිදසුනක් නොවනනේ,
    (1) හිම කන්දක් සේ දියවීම.
    (2) දෑස් පියාගෙන තමා වටව ශබ්ද හඳුනා ගැනීම.
    (3) ඉටි පන්දමක් සේ දියවීම.
    (4) තමා තෙතම ඇටයක් යැයි සිතා පැළවී, මල් පිපි මලක් බවට පත්ව එය පරිවී යෑම නිරූපණය

❖ ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති ඡායාරූප ඇසුරෙන් පිළිතුරු සපයන්න



A



B



C



D



E

31. හාස්‍ය රංගනය සඳහා වඩාත් ප්‍රකට වූ නළුවා / නිළිය වන්නේ, .
    (1) A (2) B (3) C (4) D

32. "විකෘති" නාට්‍යයේ ප්‍රධාන චරිතයට දායක වූයේ,
    (1) B (2) C (3) D (4) E

33. "සුබ සහ යස" නාට්‍යය නිර්මාණය කර එහි ප්‍රධාන චරිතයට පණ පොවන ලද්දේ,
    (1) A (2) B (3) C (4) D

34. නාට්‍ය ධර්මී ශෛලිය මඟින් දෛනික ජීවන ප්‍රශ්න කතිකා කිරීම සඳහා "ජනේලය" නම් වේදිකා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
    (1) A (2) B (3) C (4) D

35. "තාරාවෝ ඉගිලෙති" නාට්‍යයේ රංගනය සඳහා මෙන්ම ගායනය සඳහා ද දායක වූයේ,
    (1) B (2) C (3) D (4) E

36. අංගරවනය සිදු කිරීමේ දී මුහුණ ප්‍රධාන කොටස් කීපයකට බෙදනු ලැබී ද?
    (1) 4 (2) 5 (3) 6 (4) 7

37. සංගීතය කිසිදු අයුරකින් භාවිතා නොකරන වේදිකා නාට්‍යයක් වන්නේ,
    (1) කැලණි පාලම (3) මනමෙ
    (2) තලමල පිපිලා (4) සිංහබාහු

38. නාට්‍ය ගීතයක් ගායනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,
    (1) පද නිවැරදිව උච්චාරණය (3) චරිතයට උචිත භාව ප්‍රකාශනය
    (2) හඬ පාලනය (4) ගීතය ඉතා මිහිරි ලෙස ගායනය

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

39. "දීක්තල කාලගෝලෝ" නාට්‍යයේ එන නාට්‍ය ගීතයක් නොවන්නේ,
(1) අන්න බලන් සඳ.....
(2) හිටපල්ලා හිටපල්ලා නොගිහින්.....
(3) අම්බරයේ සඳ සේ දිලි .....
(4) සත් අවුරුද්දක් මෙහෙකර.....

40. වේදිකා නාට්‍ය සඳහා භාෂිත වන අභිනව සංඛ්‍යාව වන්නේ,
(1) 3 (2) 4 (3) 5 (4) 6

**

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

ii කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. මුළු ප්‍රශ්න පහකි.

1. පහත දී ඇති සංවාද ඛණ්ඩය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න:

"පොත පතේ මිස කුස පබාවතීලා අප අතර කොයිශ්ද? ඇරත් මේ' ගහෙන් එගොඩ වෙන්න බැරි තමුසේ ලඟ ඇති වීරකම මොකද්ද?"

i. ඉහත දෙබස් ඛණ්ඩය අන්තර්ගත වේදිකා නාට්‍යයේ ශෛලිය හා සම්ප්‍රදාය වෙන වෙනම නම් කරන්න. (ලකුණු 02 යි)

ii. මෙම අවස්ථාවේ නට නළිළියන් කී දෙනෙක් රංගනයේ යෙදෙද් ද? (ලකුණු 02 යි)

iii. මෙහි සඳහන් ප්‍රකාශය සිදු කරනු ලැබූ චරිතය නම් කරන්න. (ලකුණු 02 යි)

iv. ඉහත ප්‍රකාශය සිදු කළ චරිතය " තමුසේ" යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලද්දේ කා හට ද? (ලකුණු 02 යි)

v. මෙලෙසින් ප්‍රකාශයක් කිරීමට ප්‍රකාශය සිදුකළ තැනැත්තාට හේතු වූ කාරණය කුමක් ද? (ලකුණු 02 යි)

vi. **කාලගෝල** යන නමෙහි අර්ථය ලියන්න. (ලකුණු 02 යි)

2.

i. පහතරට සම්ප්‍රදායට ආවේණික ශාන්තිකර්ම 02 ක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. ඔබ ඉහත නම් කළ ශාන්තිකර්මවලට දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාලි 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

iii. ඉන් එක් නාට්‍යමය පෙළපාලියක ඇති නාට්‍යමය ලක්ෂණ 03 ක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

3.

i. අංග රචනය හඳුන්වන්න. (ලකුණු 02 යි)

ii. අංග රචනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය 02 ක් හා උපකරණ 02 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

iii. ඔබට වේදිකා නාට්‍යයක අංග රචනය කිරීමට අවස්ථාවක් ලැබුණු විට එම කාර්යය සිදු කිරීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

4.

i. රංග අභ්‍යාසයක් යනු කුමක් ද? (ලකුණු 02 යි)

ii. රංග අභ්‍යාස 04 ක් නම් කර එම එක් එක් රංග අභ්‍යාසයන් මඟින් නළුවාට ලැබෙන ප්‍රයෝජන එක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

iii. ඔබ දන්නා රංග අභ්‍යාසයක් / රංග ක්‍රීඩාවක් පියවරින් පියවර සිදු කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06 යි)

5.

i. සමාරෝපය හඳුන්වන්න. (ලකුණු 02 යි)

ii. සමාරෝපයෙහි කොටස් කීය ද? ඒවා නම් කරන්න. (ලකුණු 04 යි)

iii. ඔබ ඉහත සඳහන් කළ සමාරෝපයෙහි කොටස් විස්තර කර නාට්‍යයට වඩා වැදගත් වන්නේ කුමන සමාරෝපයැයි පහදන්න. (ලකුණු 06 යි)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

6.

i. ඔබගේ විෂය නිර්දේශයට අන්තර්ගත නාට්‍යකරුවන් 02ක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. එම නාට්‍යකරුවන් දෙදෙනා විසින් නිර්මාණය කරන ලද වේදිකා නාට්‍ය 04ක් නම් කරන්න. (ලකුණු 04 යි)

iii. ඔබ විසින් ඉහත නම් කළ එක් නාට්‍යකරුවෙකු සිංහල නාට්‍ය ඉතිහාසයට සිදු කළ සේවාව සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කර ගනිමින් නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න:

කසුන් 10 වසයේ ඉගෙනුම ලබන ඉතා ප්‍රියමනාප ගුරුවරුන්ගේ ආදරයට ලක් වූ ශිෂ්‍යයෙකි. ඔහු ඉගෙනීමට මෙන්ම ක්‍රීඩාවට ද එක සේ දක්ෂ වන අතර ඔහුගේ මව පාසලට දැනුම් දී ඇති පරිදිඔහුගේ පියා ඔහු කුඩා වියේදී මිය ගොස් ඇත. දිනක් පාසලට පැමිණි පුද්ගලයෙකු කසුන්ගේ විදුහල්පතිතුමා මුණ ගැසී තමා කසුන්ගේ පියා බවත් කසුන් මුණ ගැසී කතා කිරීමට අවශ්‍ය බවත් ප්‍රකාශ කරයි..... ඔබට අවශ්‍ය පරිදි චරිත යොදා ගත හැකි අතර පහත ශීර්ෂ යටතේ ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

i. පසුබිම, කාලය, සිදුවීම් හා වචන මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම. (ලකුණු 02 යි)

ii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම. (ලකුණු 04 යි)

iii. නොසැදෑ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම. (ලකුණු 06 යි)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

SLGURU.LK
For Educational Purpose Only